**වලිකාමම් නිරිත ප්‍රාදේශීය සභාව**
**යාපනය දිස්ත්‍රික්කය**
**----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 12 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 29 දින හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 අගෝස්තු 30 දින සභාපතිවරයා වෙත ඉදිරිපත් කරන ලදී.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, වලිකාමම් නිරිත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

## 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සුසාන භූමි 13 ක වටිනාකම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් නොකිරීම නිසා ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි. | 2020 වර්ෂයේ අවසන් ගිණුම්වල මෙම කරුණ නිවැරදි කරනු ලැබේ. | සුසාන භූමි වටිනාකම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. |
| (ආ) | වාහන 13 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබූ බැවින් මෝටර්රථ වාහන හා සයිකල් වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි. | ඊළඟ වර්ෂයේ අවසන් ගිණුම්වලට එකතු කරනු ලැබේ. | වාහන වටිනාකම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. |
| (ඇ) | රු. 10,830,080 ක පිරියත යන්ත්‍රෝපකරණ සහ රු. 6,436,106ක ලීබඩු ආදිය විනාශ කර තිබුණත්, වටිනාකම වත්කම්වල ඇතුළත් කර තිබූ බැවින්, වත්කම්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දක්වා තිබුණි. | ප්‍රවර්තන වර්ෂ අවසන් ගිණුම්වල ගලපනු ලැබේ. | විනාශ කළ භාණ්ඩ වත්කම්වලින් ඉවත් කිරීමටත් නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමටත් සුදුසු ක්‍රියාමාර්ග සභාව විසින් ගත යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) රු.377,451ක විනාශ කළ පුස්තකාල පොත්වල වටිනාකම වත්කම්වල ඇතුළත් කර තිබූ බැවින්, වත්කම්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දක්වා තිබුණි. | ප්‍රවර්තන වර්ෂ අවසන් ගිණුම්වල ගලපනු ලැබේ. | විනාශ කළ භාණ්ඩ වත්කම්වලින් ඉවත් කිරීමටත් නිවැරදි පුස්තකාල පොත්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමටත් සුදුසු ක්‍රියාමාර්ග සභාව විසින් ගත යුතුවේ. |

## 1.4 අනුකූල නොවීම

## 1.4.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) උප වගන්තිය | වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | ප්‍රවර්තන වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කරනු ලැබේ. | පනතේ විධිවිධානවලට අනුව කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) 1987 අංක 15 ප්‍රාදේශීය සභා පනත | | | |
| - 126 (iii) (ඌ) වගන්තිය | නීතිවිරෝධි දැන්වීම් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග සභාව විසින් ගෙන නොතිබුණි. | ප්‍රවර්තන වර්ෂයේ සුදුසු ක්‍රියාමාර්ග ගනු ලැබේ. | නීතිවිරෝධි දැන්වීම් සම්බන්ධයෙන් පනතේ විධිවිධානවලට අනුව සුදුසු ක්‍රියාමාර්ග සභාව විසින් ගත යුතුවේ. |
| - 158(1) වගන්තිය | හිඟ වරිපනම් බදු රු.17,250,619 ක් ගෙවීම පැහැර හැරී පුද්ගලයන්ට සභාපතිවරයා විසින් වරෙන්තු නිකුත් කර නොතිබුණි. | වරෙන්තු නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ. | හිඟ ආදායම් බදු සම්බන්ධයෙන් පනතේ විධිවිධානවලට අනුව සුදුසු ක්‍රියාමාර්ග සභාව විසින් ගත යුතුවේ. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371(2)(b) | පර්යේෂණ වාර්තා සම්බන්ධයෙන් ලබාදුන් අත්තිකාරම් රු.1,246,860ක් මෙ දක්වා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | පර්යේෂණ වාර්තා ලැබූ විගස නිරවුල් කරනු ලැබේ. | නිරවුල් නොකළ අත්තිකාරම් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසිවලට අනුකූලව සභාව විසින් කටයුතු කළ යුතු වේ. |
| - මුදල් රෙගුලාසි 571 | වර්ෂ දෙකක් ඉක්ම වූ තැන්පතු රු.254,520ක් නිරවුල් කර නොතිබුණි. | නිරවුල් කිරීමේ කටයුතු සිදු වෙමින් පවතී. | නිරවුල් නොකළ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසිවලට අනුකූලව සභාව විසින් කටයුතු කළ යුතු වේ. |

(ඇ) රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛය

| | | | |
|---|---|---|---|
| - 2018.01.24 දිනැති අංක 02/2018 දරන චක්‍රලේඛය | මානව සම්පත් සැලැස්මක් සකස්කර නොතිබූ අතර සේවකයින්ට වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණුවක් ලබාදුන් බවට තහවුරු කළ නොහැකිව පැවැතුණි. | පුහුණුවීම් ලබාදීමට කටයුතු කරමින් පවති. | චක්‍රලේඛය ප්‍රකාරව සේවකයිනට පුහුණුවීම් නියමිත කාලයේදි ලබාදීමට සභාව විසින් ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

(ඉ) අනෙකුත් චක්‍රලේඛ

| | | | |
|---|---|---|---|
| - 2018.07.19 දිනැති අංක 2018/e පළාත්පාලන -01 දරන පළාත්පාලන චක්‍රලේඛය | ප්‍රජාවට අන්තර්ජාලය මාර්ගයෙන් සේවාවන් ලබාගැනීමේ පහසුකම් සලසා දි නොතිබුණි. | පළාත්පාලන දෙපාර්තමේන්තුවට අනුමැතිය සඳහා යවා ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රජාවට අන්තර්ජාල සේවාවන් සලසා දිමට සුදුසු ක්‍රියාමාර්ග සභාව විසින් ගත යුතුවේ. |
| - 1981.12.09 දිනැති අංක 161 දරන චක්‍රලේඛය | තාක්ෂණික නිලධාරි, ආදායම් පරික්ෂක, සෞඛ්‍ය සුපරික්ෂක, රියදුරු, යන්ත්‍ර ක්‍රියාකරු, ජල සම්බන්ධතා යන්ත්‍ර ක්‍රියාකරු, විදුලි කාර්මික, කාර්යාල කාර්ය සහායක ආදි තනතුරුවල නිලධාරීන් 18දෙනෙකුට රු.26,760ක් වටිනා වැහිකබා ලබාදී තිබූ බව නිරික්ෂණය විය. | ආයතන සංග්‍රහයේ XXI පරිච්ඡේදයේ 3 වගන්තිය ප්‍රකාරව ලබාදී ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව නිලධාරීන්ට නියමිත කාලයේදි වැහිකබා ලබාදීමට සභාව විසින් ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

**1.4.2** බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වගන්තිය ප්‍රකාරව අදාල ඇතැම් ඉඩම් විකුණුම් මත 1% ක විකුණුම් බදු අයකිරීමට කටයුතු කර නොතිබුණි. | තැරැව්කරුවන් සහ නියෝජිතයන් මාර්ගයෙන් ඉඩම් විකිණීමේදි විකුණුම් බදු අයකිරීමට ක්‍රියාමාර්ග ගනු ලැබේ. | විකුණුම් බදු අයකිරීම් සිදු කිරීමට පනත ප්‍රකාරව සුදුසු ක්‍රියාමාර්ග සභාව විසින් ගත යුතු වේ. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 27,938,834 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 75,228,272 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 | | | 2018 | | |
|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 7,855,600 | 7,901,070 | 17,725,212 | 7,859,600 | 8,052,726 | 14,549,915 |
| කුලී | 11,780,161 | 17,886,020 | 280,508 | 10,233,300 | 11,928,676 | 279,758 |
| බලපත්‍ර ගාස්තු | 3,193,450 | 3,551,475 | 7,500 | 2,930,700 | 3,476,268 | 28,500 |
| වෙනත් ආදායම් | 120,085,466 | 81,775,298 | 9,404,690 | 116,186,200 | 124,153,988 | 49,990,569 |
| | 142,914,677 | 111,113,863 | 27,417,910 | 137,209,800 | 147,611,658 | 64,848,742 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 වර්ෂයේ රැස්කළ ආදායම රු. 147,611,658ක් වුවත්, 2019 වර්ෂයේ රැස්කළ ආදායම රු. 111,113,863කින් අඩු වීම නිසා 2018 වර්ෂය සමඟ සැසඳීමේදී 2019 වර්ෂයේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය රු. 36,497,795 කින් අඩු වී තිබුණි. | මුද්දර ගාස්තු, උසාවි දඩ මුදල් ඊළඟ වර්ෂයේ ආදායම් ලෙස ගිණුම් තැබීම නිසා ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය අඩු වී තිබේ. | ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය වැඩි කිරීමට ක්‍රියාමාර්ග සභාව විසින් ගත යුතු වේ. |

**2.2.3 වරිපනම් හා බදු**

| | විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | හිඟ වරිපනම් හා බදු රු.17,250,619 ක් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | අයකිරීම් සිදු කිරීමට කටයුතු කරමින් පවතී. | හිඟ වරිපනම් හා බදු නියමිත කාලයේ අයකිරීමට අවශ්‍ය කටයුතු සභාව විසින් ගත යුතු වේ. |
| (ආ) | හිඟ ජලසම්පාදන සේවා ගාස්තු රු. 73,090ක් අය කිරීමට කටයුතු කර නොතිබුණි. | අයකිරීම් සිදු කිරීමට කටයුතු කරමින් පවතී. | හිඟ ජලසම්පාදන සේවා ගාස්තු නියමිත කාලයේ අයකිරීමට අවශ්‍ය කටයුතු සභාව විසින් ගත යුතු වේ. |

**2.2.4 කුලී**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හිඟ බදු කුලී රු.275,508 ක් අයකිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | අධිකරණ තීන්දුව ප්‍රකාරව සුදුසු ක්‍රියාමාර්ග ගනු ලැබේ. | හිඟ බදු කුලී නියමිත කාලයේ අයකිරීමට අවශ්‍ය කටයුතු සභාව විසින් ගත යුතු වේ. |

**2.2.5 උසාවි දඩ මුදල්**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2019 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ මුදල් රු. 9,283,780 ක් ලැබිය යුතුව තිබුණි. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් වරයා විසින් 2020 වර්ෂයේදි ඉල්ලීම් කරන ලෙස උපදෙස් ලබාදී ඇත. | හිඟ උසාවි දඩ ගාස්තු නියමිත කාලයේ අයකිරීමට අවශ්‍ය කටයුතු සභාව විසින් ගත යුතු වේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව, මහජන සෞඛ්‍යය, පොදු උපයෝගීතා සේවාවන් සහ පොදු මංමාවත්, මහජන සුබ විහරණය, පහසුකම් හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව, සභාව විසින් ක්‍රියාත්මක කළ යුතුව තිබූ ක්‍රියාකාරකම් 30 ක් සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | 2020 වර්ෂය වෙනුවෙන් සකස් කර ඇත. | අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව, නියමිත වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට සභාව විසින් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

**(ආ) අපේක්ෂිත ප්‍රතිලාභ ළඟා කරගැනීමට අපොහොසත් වීම**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සතිපොළ ඉදිකිරිම සඳහා වැයකළ රු. 880,625 කින් අපේක්ෂා කළ ප්‍රතිඵල ළඟා කරගෙන තිබුණද, සතිපොල වර්ෂ 04ක සිට භාවිතා කර නොතිබූ හේතුවෙන් අපේක්ෂා කළ ප්‍රතිලාභ ළඟා කරගත නොහැකි වී තිබුණි. | ගොඩනැගිල්ල වෙනත් අරමුණු සඳහා භාවිතා කරනු ලැබේ. | සතිපොළ ගොඩනැගිල්ල ඉදිකිරීම මගින් නියමිත කාලය තුළදී අපේක්ෂා කළ ප්‍රතිලාභ ළඟා කර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග සභාව විසින් ගත යුතු වේ. |

**(ඇ) අතහැර දැමූ කාර්යයන්**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සන අපද්‍රව්‍ය බැහැර කිරිම, සාතකාගාරය ඉදිකිරීම, කාකදූපත සාතකාගාරය, ආනෙයිකෝට්ටෙයි ළමා උද්‍යානය ආදි කර්මාන්තයන් ක්‍රියාත්මක කිරීම සඳහා රු.17,703,828ක් වැය කර තිබුණත්, 2019 දෙසැම්බර් 31 දින වන විටත් අපේක්ෂා කළ ප්‍රතිඵල ලඟාකර නොගෙන එම ක්‍රියාකාරකම් අතහැර දමා තිබුණි. | සන අපද්‍රව්‍ය බැහැර කිරීමේ ප්‍රදේශය හමුදාවෙන් ආපසු ලබාගැනීමෙන් පසුවත්, ළමා උද්‍යානය ඉදිකිරීමේ කටයුතු අවසන්වීමෙන් පසුවත් භාවිතා කරනු ලබන බවට සඳහන් කරන අතර, කාකදූපත සාතකාගාරය භාවිතය සඳහා නුසුදුසු ලෙස සලකා භාවිතා කර නොතිබුණි. | මූලධන වැඩසටහන් මගින් අදාල කර්මාන්තයන් ක්‍රියාත්මක කිරීමටත් වත්කම් උපයෝජනය කිරීමටත් නියමිත ක්‍රියාමාර්ග සභාව විසින් ගත යුතු වේ. |

**(ඈ) සන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සන අපද්‍රව්‍ය වෙන් නොකරන අතර දෛනිකව රැස්කරනු ලබන අපද්‍රව්‍ය කැබැලි කර පස් දමා වසා නොතිබුණි. | රජයේ ඉඩම් ලබාගැනීමෙන් පසු ක්‍රියාමාර්ගයන් ගනිමින් පවති. | සන අපද්‍රව්‍ය කළමනාකරණය අනුව සන අපද්‍රව්‍ය රැස්කිරීම ඵලදායි අයුරින් සිදුකිරීමට සභාව විසින් නියමිත ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

**(ඉ) පාරිසරික ගැටළු**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා තෝරාගෙන තිබූ ප්‍රදේශයේ මැසි මදුරුවන් බෝවීම මර්ධනය සඳහා මැසි තෙල් ඉසීම සහ දුර්ගන්ධය වැලැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2020 වර්ෂයේ සුදුසු ක්‍රියාමාර්ග ගෙන ඇත. | සන අපද්‍රව්‍ය කළමනාකරණය අනුව ඵලදායි අයුරින් සභාව විසින් නියමිත ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018, 2019 වර්ෂවල ලබාදී තිබූ රු.270,000 ක ප්‍රජා මධ්‍යස්ථාන සහනාධාර සම්බන්ධයෙන් මේ දක්වා සභාව විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ප්‍රජා මධ්‍යස්ථානවලට ලබාදීමට කටයුතු කරමින් පවති. | සහනාධාර නියමිත අයුරින් භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ස්ථාවර තැන්පතු ගිණුම්වල පවතින රු.145,315,980 ක අරමුදල් භාවිතා කර සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් උපයෝජනය නොකර බැංකුවේ තැන්පත් කර තිබුණි. | සංවර්ධන කාර්යයන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමින් පවති. | සභාමේ අරමුදල් මගින් සංවර්ධන වැඩසටහන් නියමිත අයුරින් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සභාව විසින් ගත යුතු වේ. |
| (ඇ) | පසුගිය වර්ෂ 12 සිට 40 දක්වා කාලපරිච්ඡේදයේ ප්‍රාදේශීය සභාවට අයත් දේපළ වෙනුවෙන් වරිපනම් බදු නැවත තක්සේරු කිරීම් සිදුකර නොතිබුණි. | වරිපනම් බදු නැවත තක්සේරු කිරීමට කටයුතු කෙරේ. | වරිපනම් බදු සඳහා නැවත තක්සේරු කිරීම් නියමිත කාලයේ සිදු කිරීමට සභාව විසින් කටයුතු කළ යුතු වේ. |
| (ඈ) | පළාත් පාලන සහකාරවරයා විසින් සකස් කළ යුතු වාර්තා නියමිත කාලයේ ඉදිරිපත් නොකිරීමෙන් ප්‍රාදේශීය සභාවට අදාල මූලික කාර්යයන් ඉටු නොවී පැවතුණි. | වාර්තා සකස් කර ඉදිරිපත් කිරීමට ක්‍රියාමාර්ග ගනිමින් පවති. | වාර්තා නියමිත කාලයේ ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සභාව විසින් ගත යුතු වේ. |
| (ඉ) | මහජන සේවාවන් ලැයිස්තුගත කර ප්‍රදර්ශනය කර තිබුණද, එහි සඳහන් කරුණුවලට පටහැනිව මහජනතාවට සලසා තිබූ සේවාවන් කාල ප්‍රමාදයකින් පසුව සිදු කර තිබුණි. | ජනතා සේවාවන් ලැයිස්තුව සකස්කිරීමට කටයුතු කරමින් පවති. | ජනතාවට සැලසිය යුතු සේවාවන් නියමිත කාලයේ සැලසීමට ප්‍රාදේශීය සභාව විසින් කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | 2019 වර්ෂයේ ගොඩනැගිලි අයදුම්පත් 194ක් වෙනුවෙන් නියමිත කාලපරිච්ඡේදයේ අනුකූලතා සහතික නිකුත් කර නොතිබුණි. | ගොඩනැගිලි අනුකූලතා සහතික කඩිනමින් නිකුත් කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. | ගොඩනැගිලි අනුකූලතා සහතික සියල්ල නියමිත කාල පරාසය තුළ නිකුත් කිරීමට ක්‍රියාමාර්ග සභාව විසින් ගත යුතුවේ. |
| (උ) | මහජන පුස්තකාල අතුරු ව්‍යවස්ථාවේ 8.6 වගන්තිය ප්‍රකාරව, බැහැර දෙන පුස්තකාල පොත් සාමාජිකයෙකු වැඩිපුර තබාගන්නා දින ගණන වෙනුවෙන් දඩගාස්තු ගෙවිය යුතු බව සඳහන් කර තිබූ නමුත් දඩ මුදල් අයකිරීම් සිදු කර නොතිබුණි. | ප්‍රමාද ගාස්තු දඩ අයකිරිමට කටයුතු කර ඇත. | පුස්තකාල අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව දඩ ගාස්තු අයකිරිමට අවශ්‍ය කටයුතු කළ යුතුවේ. |
| (ඌ) | වරිපනම් බදු එකතු කිරීමේ රාජකාරියේ යෙදවූ නිලධාරියෙකු විසින් සිදුකළ රු.92,963ක මූල්‍ය අක්‍රමිකතාවයක් සම්බන්ධයෙන් වාර්තා නිකුත් කර නොතිබුණි. | විමර්ශන අවසන් කර වාර්තා ලැබූ පසුව විගණනයට ඉදිරිපත් කරනු ලැබේ. | මූල්‍ය අක්‍රමිකතාවය සම්බන්ධයෙන් විමර්ශනය නියමිත කාලයේ අවසන් කර වාර්තා ඉදිරිපත් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව විසින් නියමිත පරිදි මානව සම්පත් ලබාගෙන යොදවා නොතිබූ බැවින්, එවැනි මානව සම්පත් 11 ක් විසින් ඉටු කළයුතු සේවාවන් ප්‍රමාදවී තිබූ බව විගණනයේදි නිරීක්ෂණය විය. | කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීමට අනුමැතිය ඉල්ලා ඇත. | තනතුරු පුරප්පාඩු නියමිත කාලයේ පිරවීමට සුදුසු ක්‍රියාමාර්ග සභාව විසින් ගතයුතු වේ. |
| (ආ) | නිලධාරීන් දෙදෙනෙකු විසින් එකතුව රු.265,292ක ආපදා ණය හිඟ මුදල් ගෙවා නොතිබූ බව නිරීක්ෂණය විය. | විමර්ශන වාර්තා ලැබූ පසුව ක්‍රියාමාර්ග ගනු ලැබේ. | ආපදා ණය හිඟ මුදල් නිරවුල් කිරීමට සුදුසු ක්‍රියාමාර්ග සභාව විසින් ගත යුතුවේ. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 වර්ෂයේ දේපලහිමියන් 23,115දෙනෙකු වෙත "K" ආකෘති පත්‍ර බෙදාහැර නොතිබුණි. | 2020 වර්ෂයේ "K" ආකෘති පත්‍ර බෙදාහැරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. | පනත ප්‍රකාරව "K" ආකෘති පත්‍ර බෙදාහැරීමට නියමිත ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2013 වර්ෂයේ බදුදී තිබූ කාකදූපත වෙළෙඳපොල කඩකාමර හිඟ බදු කුලී රු.275,508ක් අයකර ගෙන නොතිබූ හෙයින් නඩු විභාග වෙමින් පවතින අතර මේ පිළිබඳ බැරකම්, අසම්භාව්‍ය බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ඒ ඒ මාසවල වියදම් ලෙස ගිණුම්වල ගිණුම්ගත කරනු ලැබේ. | අපේක්ෂිත බැරකම් අසම්භාව්‍ය බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුවේ. |
| (ඇ) | කල්ලුන්ඩායි සන අපද්‍රව්‍ය රැස්කිරීමේ මධ්‍යස්ථානය සම්බන්ධයෙන් නඩු විභාග වෙමින් පැවැති නමුත් මේ පිළිබඳ බැරකම්, අසම්භාව්‍ය බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ඒ ඒ මාසවල වියදම් ලෙස ගිණුම්වල ගිණුම්ගත කරනු ලැබේ. | අපේක්ෂිත බැරකම් අසම්භාව්‍ය බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුවේ. |

## 3.5 වත්කම් කළමනාකරණය

### 3.5.1 පවරා නොගත් වත්කම්

| | විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාපතිවරයා විසින් භාවිතා කරමින් පැවැති පිකප් වාහනය සභාවේ ලේකම්වරයා වෙත ආපසු භාර දී නොතිබුණි. නමුත් පසුගිය වර්ෂ 15ක කාලය පුරා මෙම වාහනය ආපසු ලබාගැනීම සඳහා ඵලදායි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙම වාහනයේ දැනට තත්ත්වය පිරික්සීම සඳහා කමිටුවක් පත්කර කටයුතු සිදුකරමින් පවතී. | මෙම වාහනය ආපසු ලබාගැනීමට සුදුසු ක්‍රියාමාර්ග සභාව විසින් නියමිත කාලය තුළ ගත යුතු වේ. |
| (ආ) | එකතුව රු. 13,775,306ක් වටිනා දේපළ 12ක් මේ දක්වා සභාවට පවරා ගෙන නොතිබුණි. | දේපළ සභාවට පවරා ගැනීම සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබේ. | දේපළ සභාවට පවරා ගැනීමට කටයුතු නියමිත කාලය තුළ සිදුකළ යුතු වේ. |

### 3.5.2 නිෂ්කාර්ය වත්කම්

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| භෞතික පරීක්ෂාවේදී බවුසර් රථ 02ක් දිරාපත් වෙමින් භාවිතයට ගත නොහැකි තත්ත්වයේ පැවතිණි. | එක් වාහනයක් සභාවට පවරා ගැනීමට අයැදුම් කර ඇති අතර අනෙක් වාහනය වෙන්දේසියේ විකිණීමට කටයුතු කර ඇත. | භාවිතයට නුසුදුසු වත්කම් සම්බන්ධයෙන් සුදුසු කටයුතු සභාව විසින් ගත යුතුවේ. |

**3.6 අනාර්ථික ගනුදෙනු**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පිහිනුම් තටාකය ඉදිකිරීම සඳහා පිට්ටනිය සුපරීක්ෂා කිරීමට පැමිණි අයට සංග්‍රහ වියදම් ලෙස රු. 98,083ක් වැයකර තිබීම අනාර්ථික ගනුදෙනුවක් ලෙස හඳුනාගෙන තිබුණි. | ඉදිරියේදි ගනුදෙනු ආර්ථිකභාවයෙන් සිදුකිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. | ආර්ථිකභාවයෙන් වියදම් සිදුකිරීමට සුදුසු කටයුතු සභාව විසින් ගත යුතුවේ. |

**4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පුනරාවර්තන වියදම් හා තථ්‍ය වියදම් අතර ප්‍රමාණාත්මක විචලනයක් නිරීක්ෂණය වීම හේතුවෙන් මෙම අයවැය ඵලදායි නොවූ අයවැයක් ලෙස දක්නට ලැබුණි. | ඉදිරියේදි අයවැය ඵලදායි අන්දමින් සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. | අයවැය නිවැරදි ආකාරයෙන් සැලසුම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සභාව විසින් ගත යුතු වේ. |